# නූතනත්ව බොරුව වසන තාක්ෂණය

බටහිර ක්‍රිස්තියානි නූතනත්වය අද මිනිසුන් හා ගැහැණුන් අතර පිළිගැනීමට ලක්වී ඇත්තේ ඉන් බිහිවුණු ඊනියා ප්‍රජාතන්ත්‍රවාදය, ඊනියා මානව අයිතිවාසිකම්, දාර්ශනික අදහස්, විද්‍යාව, පෞද්ගලික නිදහස ආදිය නිසා නොව එහි ප්‍රතිඵලයක් වූ තාක්ෂණය හේතුකොටගෙන ය. නූතනත්වය විසින් වෙන්කිරීමට උත්සාහකෙරුණ ද ඉහත සඳහන් දෑ මෙන් ම නූතනත්වයෙන් ඇති වූ අනෙක් දෑ අතර ද සම්බන්ධයක් වෙයි. එබැවින් ඉන් එකක් පමණක් ගෙන නූතනත්වයේ පිළිගැනීමට එය හේතුවිණි යැයි කීම වැරදි යැයි කෙනකුට සිතිය හැකි ය.

ඒ නිගමනය මුළුමනින් ම බැහැරකිරීමට නො හැකි ය. අනෙක් දෑ නැතිව තාක්ෂණයට පමණක් තනියම වර්ධනය විය නො හැකි ය. එහෙත් අප මෙහි දී සලකා බලන්නේ නූතනත්වය පිළිගැනීමට ලක්වූයේ කෙසේ ද යන්න ය. නිව්ටන්ගේ නියමවල ඇති ශක්‍යතාව හෝ ඡන්දයෙන් මහජන නියෝජිතයන් යැයි කියාගන්නා අය පත්කරගැනීමට ඇති හැකියාව හෝ බුද්ධිවාදය හෙවත් හේතුවාදය හෝ එලෙස පිළිගැනීමට හේතුවිණි යැයි කිව නො හැකි ය. ඒ කිසිවක් ගැන අසා නැති අයකුගේ වුවත් ජීවිතය තාක්ෂණය හේතුවෙන් වෙනස් වී ඇත. අනෙක් අතට ඒ සියල්ල බොරු බව ද ජනතාව නො දනියි.

අද බොහෝදෙනා දියුණුව යන්නෙන් අදහස්කරන්නේ මේ තාක්ෂණික දියුණුව ය. අප බොහෝ දෙනකුට අවශ්‍ය මේ තාක්ෂණික මෙවලම් අපේ ජීවිතවලට සමීප කරගැනීමට ය. නැගනහිර පළාත්සභා මැතිවරණය මේ රටේ පැවැත් වූ ඉතාමත් ම තීරණාත්මක මැතිවරණයකි. එහි ප්‍රතිපලය කුමක් දැයි අපි නො දනිමු. ඉදිරි අවුරුදු තිහක පමණ කාලයක රටේ අනාගතය ඒ මැතිවරණයෙන් තීරණය කෙරෙයි. එහෙත් අප නූතනත්වය පිළිගන්නේ එවැනි මැතිවරණ පැවැත්වීමට ඉඩකඩ ලැබෙන නිසා නොව තාක්ෂණය යොදාගැනී ඉදිකෙරෙන පාලම්, පාරවල්, වරාය ආදිය නිසා ය.

ජංගම දුරකථන, රූපවාහිනී, පරිගණක, ගුවන්ගමන් ආදිය අපේ ජීවිතවලට කෙතරම් සම්බන්ධ ද? මෙරට උගත් නුගත් බොහෝ දෙනාට පිටරට සංචාරයක් යනු කිසි දිනෙක එපා නොවන දෙයකි. විදේශයකට යෑමට නොහැකි අයකු අඩුම තරමින් කටුනායකට යෑමට ලැබෙන අවස්ථාවක් ප්‍රතික්ෂේප නොකරනු ඇත. තාක්ෂණික මෙවලම් අප දැනුවත් ව හෝ නොදැනුවත්ව හෝ තව තවත් එකිනෙකාගෙන් අප වෙන්කරන බව ඇස් පනාපිට පෙනේනට ඇත. ජංගම දුරකථනය අප එකිනෙකා සම්බන්ධකරන මෙවලමකට වඩා වෙන්කරන මෙවලමකි. දුරකථන ඇති බැවින් අපට එකට ජීවත්වීමේ අවශ්‍යතාව පැන නොනගියි. අපට දුරකථනයෙන් සම්බන්ධ විය හැකි යැයි අපි සිතමු. එහෙත් ඒ සම්බන්ධය කණ නමැති ඉන්ද්‍රිය අනෙක් ඉන්ද්‍රියයන්ගෙන් වෙන්කර ලබාගන්නා ව්‍යාජ සම්බන්ධයකි.

අද ලෝකය කුඩා වී ඇතැයි පැවසෙයි. මේ ඊනියා කුඩා බව නිසා අද දරුවෝ දෙමව්පියන්ගෙන් වෙන් ව වසති. ඇතැම් විට සැතපුම් දහස් ගණනින් වෙන් වී වාසය කරති. ඔවුන් දුරකථනයෙන් සම්බන්ධවනවා ඇත. වැඩිකල් නොගොස් පරිගණකය ඔස්සේ අතථ්‍ය (වර්චුවල්) සම්බන්ධකම් ඇතිකර ගැනීමට හැකිවනු ඇත. එහෙත් ඒ අතථ්‍ය සම්බන්ධකම් ම වනු ඇත. ලෝකය කුඩා වීමේ ප්‍රතිඵලය වී ඇත්තේ එකිනෙකාගෙන් වෙන්වීම වැඩිවීම පමණ ය. අනාගතයේ දී නූතනත්වය විසින් දැනටමත් අඩු කෙරී ඇති පුද්ගල සම්බන්ධකම් සුණු විසුණු කෙරෙනු ඇත. තම ලෝකය තම පරිගණකයට සීමා වන දිනය සියවසක් දෙකක් ඇතුළත ළඟාවනු ඇත. එදින ලෝකයට මුරුගසංවරුසාව වැසි දින වනු ඇත්තේ පුද්ගල සම්බන්ධකම් නැති මිනිසුන්ට අනෙක් මිනිසුන් සතුන් මෙන් පෙනීමට පටන්ගන්නා බැවිනි.

මෙරට උගතුන්ගේ හා බොරුකාරයන්ගේ සම්මානයට පාත්‍ර වී මියගිය ආතර් සී ක්ලාක් මහතා නූතනත්වයේ, එනම් නූතනත්ව තාක්ෂණයේ ඉසිවරයකු ලෙස සැලකෙයි. ඔහු ලංකාවේ ජීවත්වූයේ ඇයි ද යන ප්‍රශ්නයට සතුටුදායක පිළිතුරක් මෙතෙක් ලැබී නැත. කෙසේ වෙතත් ඒ මහතා බටහිර නූතනත්ව තාක්ෂණය මෙරට හා පිටරට ජනතාව අතර තව තවත් ජනප්‍රියකිරීමට වෙහෙස විය. බටහිර විද්‍යාඥයකු නොවූ ඒ මහතා බටහිර විද්‍යා ප්‍රබන්ධ උපයෝගී කරගත්තේ තාක්ෂණය ඔස්සේ බටහිර නූතනත්වය තහවුරුකිරීමට ය. මා විසින් ඉහත සඳහන්කෙරී ඇති පුරෝකථනය වැන්නක් ඒ මහතා කර නැත. එසේ කෙළේ නම් ඔහුට පිළිගැනීමක් නො ලැබෙනු ඇත. මෙරට හෝ පිටරට හෝ

© Prof. Nalin De Silva

පිළිගැනීමක් ලැබෙන්නේ නූතනත්වයට අවශ්‍ය අයුරින් ජීවත්වන්නවුන්ට මිස එහි ඇති කඨෝරත්වය හා දුර්ගුණ දකින්නන්ට නො වෙයි. නූතනත්වයට ආවඩන්නන්ට විශේෂ පිළිගැනීමක් ලැබෙන බව අමුතුවෙන් කිවයුතු නො වෙයි.

නූතනත්වයේ ආත්මය බොරුව වෙයි. අපට හැකියාව ඇත්තේ බොරුකීමට පමණකි. මා යනුවෙන් යමකු ඇතැයි පැවසීම මොන තරම් බොරුවක් ද? පුටුව, මේසය ආදියේ පැවැත්ම සම්බන්ධයෙන් ද තත්වය එසේ ය. සම්මුති සත්‍යය ද අවසානයේ දී බොරු වෙයි. අවශ්‍ය නම් එයට බොරු ඇත්ත (ඇත්ත බොරු) යැයි කිව හැකි ය. අපට කළ හැක්කේ බොරුකීම පමණක් බව හොඳින්ම අවබෝධකරගෙන ඇත්තේ නූතනත්වයේ පැවැත්මට කටයුතු කරන්නන් වීම පුදුමයක් නො වේ.  මෙරට කසිකබල් මාක්ස්වාදීන් ද ඇතුළු සියළු දේශපාලනඥයෝ නූතනත්වයේ හා තමන්ගේ පැවැත්ම වෙනුවෙන් බොරු කියති.

අපි උණු උණු ම බොරුවක් ගනිමු. අද උතුරු පළාතට ත්‍රි පුද්ගල කාර්ය සාධක මණ්ඩලයක් පත්කර ඇත. මෙය සර්වපාක්ෂික නියෝජිත කමිටුවේ වාර්තාවේ යෝජනාවක් ක්‍රියාත්මකකිරීමක් පමණකි. මේ නිසැකයෙන් ම අතුරුවාර මණ්ඩලයකි. අදාළ වාර්තාවේ 3.4 ඡෙදය යටතේ ඒ බව පැහැදිලිව කියැවෙයි. මණ්ඩලය ක්‍රියාත්මක වන්නේ උතුරු පළාතේ පළාත්සභා මැතිවරණය පැවැත්වෙන තෙක් පමණක් බවත් එහි කාර්යභාරය ආණ්ඩුකාරයාට උපදෙස්දීම හා උදවුවීම බවත් ඒ ඡෙදයෙහි සඳහන් වෙයි. ඒ බව මේ තීරුවෙන් ඒ දිනවල ම ප්‍රකාශ කෙරිණි. එහෙත් තම පැවැත්ම සඳහා බොරු කියන දේශපාලඥයෝ ද මාධ්‍යවේදීහු ද තම තමන්ට අවශ්‍ය අන්දමට ඒ විකෘතිකරමින් බොරු කීහ. අද ඒ මණ්ඩලය පත්කෙරී ඇත. දැන් අර දේශපාලනඥයන් හා මාධ්‍යවේදීන් නැවතත් තම පැවැත්ම සඳහා තමන් කලින් කී බොරුව වසාගැනීමට වෙනත් බොරු කීම ආරම්භ කර ඇත. මොවුන්ට කළහැක්කේ පිළුණු බොරුවෙන් උණු බොරුවට මාරුවීම පමණකි.

නූතනත්වයට ප්‍රජාතන්ත්‍රවාදය, මානව නිදහස, පෞද්ගලික නිදහස, හේතුවාදය හෙවත් බුද්ධිවාදය ආදී අනෙක් සියළු බොරු වසාගැනීමට හැකි වී ඇත්තේ මිනිසුන් හා ගැහැණුන් තාක්‍ෂණයට වශී වී ඇති බැවිනි. පෞද්ගලිකත්වය හා පුද්ගල ඉන්ද්‍රිය පිනවීම නූතනත්වයේ ප්‍රධාන අංග බැවින් හා තාෂණයෙන් ඒ වර්ධනය කෙරෙන බැවින් තාක්‍ෂණයට වැදගත් තැනක් හිමිවෙයි. ඩෙරීඩා පඬිවරයා ඉදිරිපත් කළ සංකල්පයක් වන්නේ විසංයෝජනය (ඩිකන්ස්ට්‍රක්ෂන්) ය. ඊනියා පශ්චාත්නූතනවාදීන් පෙන්නුම්කිරීමට තැත්කරන බරපතළ බවක් හෝ සංකීර්ණ බවක් හෝ එහි නැත. විසංයෝජනය යන්න ද විසංයෝජනය කළ යුතුව ඇත.

අපි උදාහරණයක් දෙකක් ගනිමු. බුද්ධිවාදය හෙවත් හේතුවාදය (රැෂනලිසම්) යන්න සාමාන්‍යයෙහ් යොදාගැනෙන්නේ දාර්ශනික අර්ථයකින් නො වේ. දාර්ශනික වශයෙන් ගත්කල බුද්ධිවාදීහු විඥානවාදීහු වෙති. එහෙත් මෙරට සහ අනෙක් රටවල ද බුද්ධිවාදය යන්නෙන් බොහෝවිට අදහස්කරන්නේ අනුභූතිවාදයක් (එම්පිරිසිසම්) හා තර්කණය (රීසනින්) යොදාගැනීමකි. ආගමික විශ්වාස විසිකර විශ්වාසය වෙනුවට අනුභූතිය හා තර්කණය යොදාගැනීම ඊනියා ආලෝකනනයෙන් සිදුවිණි යැයි නූතනත්වයේ පඬිවරු කියති. මොවුන් එහි දී එක් පැත්තකින් කීමට තැත්කරන්නේ අනුභූතියට සංකල්ප අවශ්‍ය නොවන බව ය. අප යමක් දකින්නේ සංකල්පයකින් තොරව යැයි ඔවුහු අපට කියති. ඒ බොරුවකි. බර්ට්‍රන්ඩ් රසල් විද්වතා ද ඇතුළු බොහෝ බටහිර නූතනත්වයේ දාර්ශනිකයෝ විවිධ උපායවලින් අපට මේ බොරුව කියා දීමට උත්සාහකරති. ඔවුන්ට අනුව රතුබව, නිල්බව (බ්ලුයිෂ්නස්) යනුවෙන් අනුභූතීන් ඇත. අහස නිල්පාට වේ යන්න වාක්‍යයකි. අහස යනුවෙන් වස්තුවක් තිබුණත් නැතත් අපට නිල්පාට අහසක් දෘශ්‍යමාන වෙයි. ඔවුන් කියන්නේ අප එසේ වචන හා වාක්‍ය යොදාගත්ත ද වචනවලින් ස්වායත්ත වූ නිල්බවක් ඇති බව හා සංකල්පවලින් තොරව ඒ සංජානනය කළහැකි බව ය. මේ තරම් බොරුවක් තවත් නැත. නිල්බව රතුබවෙන් වෙනස් බව වචන නොදන්නා ළදරුවකුට වුව ද තේරුම් ගතහැකි බව පෙන්වා දිය හැකි ය. එහෙත් එයින් කියන්නේ සංකල්ප නැතිව සංජානන ඇති බව නො වෙයි. එසේ නම් කැමරාවට ද සංජානන තිබිය යුතු ට. ළදරුවාට වචන නැතිවුව ද සංකල්ප ඇත. සංකල්ප යනු වචනවලින් ම ප්‍රකාශ කෙරෙන දෑ නො වෙයි. චිත්තරූප ද සංකල්ප වෙයි. සංකල්පයක් නොමැතිව සංජානන නැත. එසේ ඇති බවට විශ්වාසයක් බටහිර දාර්ශනිකයන් විසින් ගොඩනැගී ඇත. බටහිරයන් ආගමික විශ්වාස විසිකෙළේ යැයි කියන්නේ මෙවැනි විශ්වාස තම දාර්ශනික මල්ලෙහි ඔබාගනිමිනි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva